අධ්‍යාපන අමාත්‍යාංශය
கல்வி அமைச்சு
Ministry of Education

'ඉසුරුපාය', බත්තරමුල්ල, ශ්‍රී ලංකාව.
'இசுருபாய', பத்தரமுல்ல, இலங்கை.
'Isurupaya', Battaramulla, Sri Lanka.
+94112785141-50 +94112785818
info@moe.gov.lk www.moe.gov.lk

මගේ යොමුව / எனது இல. / My Ref. ED/04/59/07/04/04 (2024)

ඔබේ යොමුව / உமது இல. / Your Ref.

දිනය / திகதி / Date 2023.09.18

පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්,

කලාප අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්,

පීඨාධිපතිවරුන්,

**ශ්‍රී ලංකා ගුරු අධ්‍යාපනඥ සේවයේ වාර්ෂික ස්ථාන මාරු - 2024**

2023.07.10 දිනැතිව නිකුත් කරන ලද අමාත්‍යාංශ චක්‍රලේඛ අංක 30/2023 අනුව මේ සමග ඇමුණුම 01 යටතේ දක්වා ඇති ලේඛනයේ සඳහන් ස්ථාන මාරු වීම් 2024.01.01 දින සිට ක්‍රියාත්මක වන පරිදි අනුමත කරමි. අධ්‍යාපන අමාත්‍යාංශයේ www.moe.gov.lk වෙබ් අඩවියේ පළකර ඇති මෙම ස්ථාන මාරු නියෝග ස්ථාන මාරු කරන ලද ඔබ ආයතනයේ සියලුම නිලධාරීන්ට දැන ගැනීමට සලස්වා නියමිත දිනයේ අභිනව සේවා ස්ථානයේ වැඩ භාර ගන්නා ලෙස ඔවුනට දැනුම් දෙනු මැනවි.

02. මෙම නිලධාරීන්ට රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් අංක 2310/ 29 දරණ අති විශේෂ ගැසට් පත්‍රයේ පල කර ඇති කාර්ය පටිපාටික රීති ( කාණ්ඩ අංක 1) හි XVIII පරිච්ඡේදයේ විධිවිධානවලට අනුකූලව තමන්ගේ ස්ථාන මාරු ඉල්ලීම පිළිබඳ වාර්ෂික ස්ථාන මාරුවීම් කමිටුවේ අවධානයට යොමු වී නොමැත්තේ නම් පමණක් ඒ අනුව අභියාචනා ඉදිරිපත් කළ හැකිය. අභියාචනා ඉල්ලුම් පත්‍රයේ ආදර්ශයක් (ඇමුණුම් 02) මේ සමඟ අමුණා ඇති අතර එම ආකෘති පත්‍රය අනුව සකස් කරගත් අභියාචනා ඉල්ලුම්පත් 2023.09.30 දිනට ප්‍රථම මා වෙත යොමු කරන මෙන් කාරුණිකව දන්වමි. එම අභියාචනා ඉල්ලුම්පතෙහි ස්කෑන් පිටපතක් (Scan Copy), "moesltes.branch@gmail.com" වෙත විද්‍යුත් තැපැලෙන් යොමු කල යුතු වේ. ස්ථාන මාරු ලේඛනයේ අදාළ නිලධරයගේ නමට ඉදිරියෙන් සඳහන් කර ඇති අනු අංකය අභියාචනා ඉල්ලුම් පත්‍රයේ අනිවාර්යයෙන් සඳහන් කළ යුතු අතර 2023.09.30 දිනට පසුව ලැබෙන අභියාචනා සලකා නොබලන බව ද අදාළ නිලධාරීන්ට දැන්විය යුතු වේ.

03. අභියාචනා ඉදිරිපත් නොකරන්නේ නම් විධිමත් පරිදි වර්තමාන සේවා ස්ථානයෙන් නිදහස් වී ස්ථාන මාරුව ක්‍රියාත්මක වන 2024.01.01 දින නව සේවා ස්ථානයේ රාජකාරී භාරගෙන ආයතන ප්‍රධානි මඟින් මේ සමඟ අමුණා ඇති ආකෘතිය (ඇමුණුම 03) අනුව ගුරු අධ්‍යාපනඥ ශාඛාව වෙත දැනුම් දෙන ලෙස කාරුණිකව දන්වමි.

04. ඔබ ජාතික අධ්‍යාපන විද්‍යාපීඨයෙන් /පළාතට, කලාපයට අයත් ගුරු විද්‍යාලයෙන් / ගුරු මධ්‍යස්ථානයෙන් පිටතට ස්ථාන මාරුවීම් ලබා දී ඇති නිලධරයන්, අනුප්‍රාප්තිකයන් පැමිණෙන තෙක් රඳවා නොගෙන නියමිත දින නව සේවා ස්ථානයේ රාජකාරී භාරගැනීමට හැකිවන සේ මුදා හැරීමට කටයුතු කරන ලෙස දන්වමි.

05. තවද, ස්ථාන මාරුවී යාමට පෙර නිලධාරියා භාරයේ පවතින රජයට අයත් ලිපිලේඛන හා බඩු බාහිරාදිය ආයතන ප්‍රධානියා විසින් නම් කරනු ලබන නිලධාරියෙකුට විධිමත්ව භාරදීමට කටයුතු කරන ලෙසද අදාළ නිලධාරීන්ට දැනුම් දෙන මෙන් වැඩිදුරටත් දන්වමි.

එම්.එන්. රණසිංහ
ලේකම්
අධ්‍යාපන අමාත්‍යාංශය